# 15. කුසලාකුසලං

## පඤ්චදසමො පාඨො



මනොපුබ්බඞ්ගමා ධම්මා - මනොසෙට්ඨා මනොමයා;
මනසා චෙ පදුට්ඨෙන - භාසති වා කරොති වා
තතො නං දුක්ඛමන්වෙති - චක්ක'ංව වහතො පදං

මනොපුබ්බඞ්ගමා ධම්මා - මනොසෙට්ඨා මනොමයා;
මනසා චෙ පසන්නෙන - භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති - ඡායාව අනපායිනී

අක්කොච්ඡි මං, අවධි මං, - අජිනි මං, අහාසි මෙ,
යෙ ච තං උපනය්හන්ති - වෙරං තෙසං න සම්මති

අක්කොච්ඡි මං, අවධි මං, - අජිනි මං, අහාසි මෙ,
යෙ තං න උපනය්හන්ති - වෙරං තෙසූපසම්මති.

(ධම්මපදය යමක වග්ගය)

## වචන මාලාව

1 .පුබ්බඞ්ගමා - පෙරටුකොට
2. මනොමයා - සිතින් ම උපන්
3. පදුට්ඨේන - අතිශයින් දූෂිත
4. අන්වේති - අනුව එයි
5. අක්කොච්ඡි - බැන්නේ ය
6. මං - මා, මට
7. අවධි - ගැසුවේ ය
8. අජිනි - පැරදුවේ ය
9. අහාසි - පැහැර ගත්තේ ය
10. යෙ - යමෙක්
11. තං - එය
12. උපනය්හන්ති - මනසින් බැඳෙත්
13. තෙසං - ඔවුන්ගේ
14. උපසම්මති - සන්සිඳෙයි

## අතීත කාලය

වර්තමාන හා අනාගත කාලවල ක්‍රියාපද පිළිබඳ අපි මුල දී උගත්තෙමු. අතීත කාලයේ ක්‍රියාපද සැකසීමේ දී ද භාවිත වන ප්‍රත්‍යය හයක් (6) තිබේ. ඒවා පහත වගුවෙහි දැක්වේ.

අතීතකාල (අජ්ජතනී) ප්‍රත්‍ය මාලාව

| පුරිස | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨම පුරිස | ඉ | ඉංසු |
| මජ්ඣිම පුරිස | ඔ | ඉත්ථ |
| උත්තම පුරිස | ඉං | ඉම්හ |

- අතීත කාලයේ ක්‍රියාපද මුලට 'අ' අකුර යොදා කියනු ලැබේ.
- එසේ නැතිව ද ලිවීමට හැකි ය.
- එම නිසා අතීත පද ආකාර දෙකකින් පෙනී සිටියි.
- වගුවේ ඇති අකුරු, ක්‍රියා මූලයට එක් කළ විට එම පදය අතීත වේ.
- ඉහත පාඩමේ ගාථා දෙකෙහි අජිනි, අක්කොච්ඡි, අහාසි වැනි අතීත කාල ක්‍රියාපද කිහිපයක් හමු විය.
- ඒ අනුව අතීත කාලයේ ක්‍රියා පද හඳුනාගන්න.
- වර්තමාන හා අනාගත කාලවල මෙන් ම මෙහි දී පුරුෂ තුනෙහි ම වරනැගේ.

අතීත කාලයේ ක්‍රියාපද වරනැගෙන අයුරු බලන්න.

| පුරිස | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨම පුරිස | (අභව + ඉ) - අභවි<br>(භව + ඉ) - භවි | (අභව + ඉංසු) - අභවිංසු<br>(භව + ඉංසු) - භවිංසු |
| මජ්ඣිම පුරිස | (අභව + ඔ) - අභවො<br>(භව + ඔ) - භවො | (අභව + ඉත්ථ) - අභවිත්ථ<br>(භව + ඉත්ථ) - භවිත්ථ |
| උත්තම පුරිස | (අභව + ඉං) - අභවිං<br>(භව + ඉං) - භවිං | (අභව + ඉම්හ) - අභවිම්හ<br>(භව + ඉම්හ) - භවිම්හ |

එහි අර්ථය මෙසේ ය.

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | වීය | වූහ |
| මධ්‍යම පුරුෂ | වූවෙහි | වූවෙහු |
| උත්තම පුරුෂ | වූයෙමි | වූයෙමු |

## අතීත කාලයේ සරල වාක්‍ය නිර්මාණය කරන අයුරු බලන්න.

උදා:-

01. ඔහු කීවේ ය. - සො අභාසි.

02. මිනිස්සු කීහ. - මනුස්සා භාසිංසු.

03. නුඹ කීවෙහි. - ත්වං භාසො.

04. නුඹලා කීවෙහු. - තුම්හෙ අභාසිත්ථ.

05. මම කීවෙමි. - අහං අභාසිං.

06. අපි කීවෙමු. - මයං අභාසිම්හ.

## අභ්‍යාසය 15 1

1. පහත සඳහන් වගන්ති සිංහලයට නගන්න.

1. සිගාලො වනං ගච්ඡි.
2. සාරථී රථං ආනෙසි.
3. මුනි ධම්මං අභාසි.
4. දණ්ඩි යට්ඨිනා භොගිං පහරි.
5. කපයො අහිනො සීසං පහරිංසු.

2. පහත සඳහන් වගන්ති පාලියට නගන්න.

1. පච්කාරයා බල්ලාට ගැසුවේ ය.
2. ඉසිවරු බෝධිය ද බුදුන් ද වැන්දහ.
3. නෑයෝ ආගන්තුකයන්ට එළුවන් දුන්හ.
4. තොපි සිටුවරුන්ගේ ප්‍රාසාදවල කුමක් කළෙහු ද?
5. වධකයා කඩුවෙන් සොරාගේ හිස සින්දේ ය.

3. ඔබ උදෑසන පිබිදී කරන ලද ක්‍රියා පහක් යොදා ගෙන අතීත කාලයේ පාලි වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

4. ක්‍රියාපද දහයක් කාල තුනෙහි පඨම පුරුෂ ඒකවචනයෙහි වරනගා පහත සඳහන් වගුව පුරවන්න. (මේ සඳහා ඔබගේ අභ්‍යාස පොත භාවිත කරන්න)

| පඨම පුරිස ඒකවචන | | |
|---|---|---|
| වර්තමාන කාලය | අනාගත කාලය | අතීත කාලය |
| උදා :- භවති | භවිස්සති | අභවි |

5. ඔබ කැමති ක්‍රියා මූල (ධාතු) දෙකක් අතීත කාලයේ පුරුෂ තුනෙහි වරනගා අර්ථය ලියන්න.

6. මෙම පාඩමේ ඇති ගාථා සිංහලට නගන්න.

**මෙම ක්‍රියාපදවල අර්ථ පාඩම් කරන්න.**

1. පාලයි - පාලනය කළේ ය
2. නච්චි - නැටුවේ ය
3. ජීවි - ජීවත් වි ය
4. නහායි - නෑවේ ය
5. ඩසි - දෂ්ට කළේ ය
6. මාරෙසි - මැරුවේ ය
7. අකිණි - මිලට ගත්තේ ය
8. විකකිණි - විකුණුවේ ය
9. අයාචි - ඉල්ලුවේ ය
10. රක්ඛි - රැක්කේ ය
11. අකීළි - සෙල්ලම් කළේ ය
12. අතරි - තරණය කළේ ය
13. අගායි - ගායනා කළේ ය
14. අපූරි - පිරවී ය
15. අජයි - දිනුවේ ය
16. ඨපි - තැබුවේ ය
17. වසසි - වැස්සේ ය
18. වඩ්ඪි - වැඩුවේ ය
19. අදාසි - දුන්නේ ය
20. අචින්ති - සිතුවේ ය